# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,608—1958 දෙසැම්බර් 5 වැනි සිකුරාද—5.12.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාගේ කරන ප්‍රකාශන ... | — | රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | 3664 |
| අග්‍රාණ්ඩුකාරතුමාගේ කරන පත් කිරීම් ... | 3661 | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 3664 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 3662 | මිළ පාලන දන්වීම් .... .... .... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 3662 | විවිධ දෙපාර්තමේන්තු දන්වීම් ... ... | 3667 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 3663 | " සුරාබදු ආඥාපණත " පිළිබඳ දන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1958 අංක 522**

අංකය : ඩී. 31/රෙක්ට.

**යුද්ධ හමුදව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1958 ජනවාරි මස 1 වැනි දින සිට, තාවකාලික මේජර් කෙනෙකු වශයෙන් කපිතන් තැන්පත් සී. ඒ. බී. රත්නායක, ඇස්.ආර්.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 24 දින,
කොළඹ 1.

---

**1958 අංක 523**

අංකය : ඩී. 31/රෙක්ට.

**යුද්ධ හමුදව—නිත්‍ය හටසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

තාවකාලික කපිතන්වරුන් වශයෙන්—

ලෙප්ටිනන්ට් තැන්පත් ඇම්. ඇස්. සමරවීර, සී.ඇල්.අයි., 1958 ජූලි මස 30 වැනි දින සිට.

ලෙප්ටිනන්ට් තැන්පත් ජේ. ජී. බල්තසාර්, සී.ඇල්.අයි., 1958 අගෝස්තු මස 11 වැනි දින සිට.

ලෙප්ටිනන්ට් තැන්පත් සී. ඇෆ්. ඩබ්ලිව්. පෙරේරා, සී.ඊ.ඇස්.සී., 1958 අගෝස්තු මස 11 වැනි දින සිට.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 28 දින.
කොළඹ 1,

**1958 අංක 524**

අංකය : ඩී. 42/රෙක්ට.

**නිලධාරියෙක් පත්කිරීම—රාජකීය ලංකා නාවුක හමුදව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවුක හමුදවේ පහත සඳහන් කරන ලද පත්කිරීම අනුමත කොට තිබේ:—

1958 නොවැම්බර් මස 10 වැනි දින සිට, රාජිනියන් වහන්සේගේ ලංකා සේවයේ නියුක්ත "කොරවක්කා" නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන්

කොමිෂන් බලපත්‍ර ලත් බෝසන් තැන්පත්, ඒ. ඒ. එච්. වැන් රෙයික්, රාජකීය ලංකා නාවුක හමුදව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් 24 දින,
කොළඹ1 .

**1958 අංක 525**

අංකය : ඩී. 42/රෙක්ට.

**නිලධාරීන් පත්කිරීම්—රාජකීය ලංකා නාවුක හමුදව**

1958 නොවැම්බර් මස 7 වැනි දින සහ අංක 11,579 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ, 3315 වැනි පිටුවේ I වැනි කොටසේ (I) වැනි ඡේදය යටතේ පළ කරන ලද 1958 අංක 484 දරණ නිවේදනය පහත දක්වා ඇති පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" කොමිෂන් බලපත්‍ර ලත් බෝසන් තැන්පත් ඒ. ඒ. එච්. වැන් රෙයික්, රාජකීය ලංකා නාවුක හමුදව " යන වචන වෙනුවට " වැඩ බලන ලෙප්ටිනන්ට් තැන්පත් කේ. ජේ. ආර්. සර්පන්ච්, රාජකීය ලංකා නාවුක හමුදව " යන වචන යෙදීම.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් 19 දින,
කොළඹ 1.

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 526**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේය :—

ඊ. 183/53.

1958 ඔක්තෝබර් මස 28 වෙනි දින පටන්, නැවත නියමයක් කරන තුරු සී. බාලසිංහම් මහතා (සී.සී.ඇස්.), භාණ්ඩාගාරයේ සැපයීම්, සේවා සංඛ්‍යා සහ මුදල් පාලක වශයෙන්.

ඊ. 184/55.

1958 ඔක්තෝබර් මස 28 වෙනි දින පටන්, නැවත නියමයක් කරන තුරු වී. ඇම්. පීරිස් මහතා (සී.සී.ඇස්.), භාණ්ඩාගාරයේ සංවිධාන සහ ක්‍රම කොට්ඨාශයේ අධ්‍යක්ෂ වශයෙන්.

ඊ. 361/57.

1958 ඔක්තෝබර් මස 15 වැනි දින සිට, ඊ. සී. ඇස්. පෝල් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල ආණ්ඩුවේ ඛනිජ විද්‍යාඥ ඇල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා සවකීය රාජකාරිවලට අතිරේකව කර්මාන්ත අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඊ. 236/58.

1958 නොවැම්බර් මස 6 වැනි දින සිට, ආර්. ජේ. ජී. ද මැල් මහතා (සී.සී.ඇස්.), දිවයිනට නැවත පැමිණෙන තුරු ගොවිජන සේවා කොමසාරිස් ඇම්. ඇස්. පෙරේරා මහතා (සී.සී.ඇස්.), සවකීය රාජ කායීවලට අතිරේකව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

ඊ. 403/57.

1958 පෙබරවාරි මස 18 වෙනි දින සිට ආණ්ඩුවේ සහකාර නගර නිර්මාණක ඇන්. ගුණරත්න මහතා ආණ්ඩුවේ නගර නිර්මාණක වශයෙන්.

ඊ. 188/55.

1958 ඔක්තෝබර් මස 20 වෙනි දින පටන්, නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න මහතා (සී.සී.ඇස්.), සහකාර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වශයෙන්.

ඊ. 286/58.

1958 ඔක්තෝබර් මස 29 වෙනි දින පටන්, නැවත නියමයක් කරන තුරු බී. එච්. ද සොයිසා මහතා (සී.සී.ඇස්.), අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වශයෙන්.

ඊ. 139/58.

1958 ඔක්තෝබර් මස 28 වෙනි දින සිට, නැවත නියමයක් කරන තුරු සහකාර ජනලෙඛන සහ සංඛ්‍යාලෙඛන අධ්‍යක්ෂ ජී. ඩබ්ලිව්. ඒ. තම්පො මහතා නියෝජ්‍ය ජනලෙඛන සහ සංඛ්‍යාලෙඛන අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958වේ දෙසැම්බර් මස 2 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායීාලයේදීය.
තැ.පෙ. 500, කොළඹ 1,

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 527**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේ.ඒ.ඒ 2/48.

එස්. ආර්. විජෙයතිලක මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 නොවැම්බර් 21 වැනි දින, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 8,403 නඩුවේ තීන්දුව දීමට හා 1958 නොවැම්බර් 26 වැනි දින, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 5,015 නඩුව ඇහීමට, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ. එල්. 51ඒ./54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. එම්. තර්මලිංගම් මහතා, 1958 නොවැම්බර් 27 වැනි දින හා 28 වැනි දිනයන්හි, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට,

අංකය : ජේ.එල්. 62ඒ./57.

ජී. තෝමස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. එල්. පින්ටෝ මහතා, 1958 නොවැම්බර් 20 වැනි දින පටන් 25 වැනි දින දක්වා, බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේ. එල්. 1ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ආර්. පීරිස් මහතා, 1958 නොවැම්බර් 24 වැනි දින, රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ. එල්. 71ඒ.51.

ඩී. විමලරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඕ. සල්ගාදු මහතා, 1958 නොවැම්බර් 21 වැනි දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ. එල්. 2ඒ./56.

ඩී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා, 1958 නොවැම්බර් 26 වැනි දින පටන් 28 වැනි දින දක්වා, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට' මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේ.එල්. 1/48.

ඩබ්ලිව්. ඊ. අබේකෝන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා, 1958 නොවැම්බර් 26 වැනි දින, හලාවත හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේ.එල්. 67ඒ./58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. පී. ද සිල්වා මහතා, 1958 නොවැම්බර් 22 වැනි දින පටන් 26 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ.එල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා, 1958 නොවැම්බර් 25 වැනි දින, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා කුරුණෑගල, කනදුල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ.එල්. 68/48.

ජී. තෝමස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, කේ. වී. නඩරාජා මහතා, 1958 නොවැම්බර් 21 වැනි දින පටන් 25 වැනි දින දක්වා, බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේ.එල්. 66ඒ/54.

සී. තනබාලසිංහම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. පී. සී. කැරන් මහතා, 1958 නොවැම්බර් 24 වැනි දින, මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධූරයට.

අංකය : ජේ.එල්. 59ඒ/56.

ඒ. එම්. එෆ්. සිරිවර්ධන මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා 1958 නොවැම්බර් 29 වැනි දින, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට, හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය : ජේ.එල්. 62ඒ/57.

ජේ. එෆ්. ඒ. සෝසා මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එච්. අබේසේකර මහතා, 1958 නොවැම්බර් 21 වැනි දින පටන්, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට හා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට.

අංකය: ජේ.එල්. 21ඒ/56.

ඩී. එච්. ද එස්. ගුණවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ආර්. පීරිස් මහතා, 1958 දෙසැම්බර් 1 වැනි හා 9 වැනි දිනයන්හි, රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධූරයට; රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධූරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධූරයට.

අංකය : ජේ.එල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා, 1958 දෙසැම්බර් 3 වැනි හා 6 වැනි දිනයන්හි, ත්‍රිකුණාමලයේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ.ඒ.ඒ. 10/48.

සී. ඒ. එල්. කොරෙයා මහතා 1958 දෙසැම්බර් 18 වැනි හා 19 වැනි දිනයන්හි හලාවත මහෙස්ත්‍රාත් උසාවියේ අංක 17,773 නඩුව ඇහීමට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ.එල්. 68/48.

ටී. එෆ්. බ්ලාසේ මහතා, 1958 නොවැම්බර් 24 වැනි දින පටන් නැවත නියමයක් කරන තුරු, බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පී. එල්/පී.6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර, ඊ. ගුණසේකර මහතා 1958 නොවැම්බර් 19 වැනි දින, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා වැලිගම් කෝරළේ හා ගහබඩ පත්තුවේ, ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී. එල්./එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජ මහතා, 1958 දෙසැම්බර් 2 වැනි දින පටන් 6වැනි දින දක්වා, පේදුරු තුඩුව දිස්ත්‍රික්කයේ, තැන්මරඩච්, පච්චිලැයිපෙලෙයි-කරච්චි, හා පූනකාරි-කුන්නුකායි ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.ඒ.ඒ. 39/57.

එල්. සේනානායක මහතා, 1958 නොවැම්බර් 28 වැනි දින, ගල්ගමුවෙ ගම්බද උසාවියේ අංක සී.ආර්.එම්. 8,796 නඩුව ඇහීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ, ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට හා හිරියාල හත්පත්තුවේ, ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පී. එල්./එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. මයිල්වාගනම් මහතා 1958 දෙසැම්බර් 1 වැනි දින හා 2 වැනි දිනයන්හි, වවුනියා හා යාපන දිස්ත්‍රික්කවල, උතුරු වවුනියාව හා මුහුදුබඩ පත්තුවේ, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා පූනකාරි-කුන්නුකායි ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1958 නොවැම්බර් 27 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ.පෙ. අංකය. 573,
කොළඹ 12.

---

# වෙනත් පත් කිරීම්

**1958 අංක 528**

අංකය : ඩී. 32/රෙක්ට්.

## රාජකීය ලංකා නාවුක හමුදාවේ නිලධාරියෙක් උසස් කිරීම

1958 නොවැම්බර් මස 1 වැනි දින සිට, වැඩබලන ලෙෆ්ට්ටිනන්ට් කෙනෙකු වශයෙන්—

උප ලෙෆ්ට්ටිනන්ට් තැන්පත් එච්. ඒ. සිල්වා—රාජකීය ලංකා නාවුක හමුදාව.

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 1.

**1958 අංක 529**

අංකය : ඒ. ඇම්. 5/1/56.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

ඩී. බී. රණසිංහ මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාරවරයකු සහ නිල නොලත් මහේස්ත්‍රාත්වරයකු වශයෙන්ද,

ඒ. ටී. බස්නායක මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාරවරයකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරයකු වශයෙන්ද,

ඩබ්ලිව්. ඩොනල්ඩ් පීරිස් මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,

ජොඑල් පෝල් මහතා යාපනය අධිකරණ කොට්ඨාශය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද

පත්කර ඇත්තේය.

දිව්රුම් සම්බන්ධ ආඥාපනතේ 12 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 නොවැම්බර් මස 22 වෙනි දින සිට කේ. තවසිපිල්ලේ මහතා පේදුරුතුඩුව අධිකරණ කොට්ඨාශය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයකු වශයෙන්ද,

1958 නොවැම්බර් මස 22 වෙනි දින සිට ඇස්. අප්පතුරේ මහතා යාපනය අධිකරණ කොට්ඨාශය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයකු වශයෙන්ද,

1958 නොවැම්බර් මස 22 වෙනි දින සිට ඇස්. ආර්. ජේකබ් මහතා යාපනය අධිකරණ කොට්ඨාශය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයකු වශයෙන්ද,

1958 නොවැම්බර් මස 22 වෙනි දින සිට ටී. බී. දුම්බුකොල මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයකු වශයෙන්ද,

1958 නොවැම්බර් මස 27 වෙනි දින සිට ඇස්. ඒ. සමරනායක මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයකු වශයෙන්ද,

1958 නොවැම්බර් මස 27 වෙනි දින සිට ඇස්. ඇල්. මොහමඩ් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිව්රුම් කොමසාරිස්වරයකු වශයෙන්ද,

පත්කර ඇත්තේය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 නොවැම්බර් මස 13 වෙනි දින සිට කේ. වෛත්‍යලිංගම් මහතා නැවත වැඩ භාරගන්නාතුරු යාපනේ දිස්ත්‍රික්කයේ අනලෙතිව්–ඉළුවතිව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට අයි. නඩරාජා මහතාද,

1958 නොවැම්බර් මස 15 වෙනි දින සිට ඩී. එස්. එදිරිසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගන්දහය කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ටී. බී. අරඹෙපොල මහතාද,

1958 නොවැම්බර් මස 17 වෙනි දින සිට එස්. බී. දෙලුන්ගහවත්ත මහතා නැවත වැඩ භාරගන්නාතුරු බදුලු දිස්ත්‍රික්කයේ මැදපළාත සහ යටි පලාත කෝරලවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පී. බී. රත්නායක මහතාද,

1958 නොවැම්බර් මස 21 වෙනි දින සිට පී. බී. රත්නායක මහතා නැවත වැඩ භාරගන්නාතුරු බදුලු දිස්ත්‍රික්කයේ උඩපලාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එස්. බී. දෙලුන්ගහවත්ත මහතාද,

1958 නොවැම්බර් මස 22 වෙනි දින සිට මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන් සිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයට ඩී. කේ. පන්ඩිතරත්න මහතාද,

1958 නොවැම්බර් මස 23 වෙනි දින සිට එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා වැඩ භාරගන්නාතුරු කොළඹ දිස්ත්‍රික්කයේ මොරටු කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එම්. ඩී. එස්. ජයවර්ධන මහතාද,

1958 නොවැම්බර් මස 26 වෙනි දින සිට ඒ. බී. ඒකනායක මහතා නැවත වැඩ භාරගන්නාතුරු මහනුවර දිස්ත්‍රික්කයේ පන්විල කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පී. බී. තෙන්නකෝන් මහතාද,

1958 නොවැම්බර් මස 29 වෙනි දින සිට පී. ඒ. වනසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු බදුලු දිස්ත්‍රික්කයේ පස්සර කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. පී. එස්. විජේතුංග මහතාද,

පත්කර ඇත්තේය

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1958 දෙසැම්බර් මස 2 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

### 1958 අංක 530

දැනට මහාභාරකාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ පළමුවැනි ශ්‍රෙණියේ නිලධාරියකු වන, ඇස්. ඒ. ඩී. විල්fප්‍රඩ් මහතා ආර්. ඒ. පී. පෙරේරා මහතා වෙනුවට, භාරකාර නිලධාරියකු වශයෙන් කටයුතු කිරීමට, මහාභාරකාරතුමා විසින් පත්කර සිටින බවත්, එසේ කටයුතු කරන කාලය තුළදී මහාභාරකාරතුමා වෙනුවට ලියකියවිලි, වව්චර් ආදියට අත්සන් කිරීමට ඔහුට බලය දී තිබෙන බවත්, මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරණු ලැබේ.

1957 ජුනි 25 වැනි දින අංක 11,137 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස
කොළඹදීය.

### 1958 අංක 531

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් මහපතිරන්නැහෙලාගේ පද්මිනී පතිරත්න මහත්මියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1958 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දීය.

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

### 1958 අංක 532

මෙහි පහත සඳහන් පත්වීම 1958.11.26 වැනි දින සිට ක්‍රියාත්මක වන ලෙස ම විසින් නියම කර ඇත :—

'' විධායක ලිපිකාර සේවයේ 2 වැනි ශ්‍රෙණියේ ලිපිකරු දෙන් fප්‍රැන්සිස් කුලතුංග මහතා කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කායර්‍යාලයයෙහි සේවය කරමින් කළුතර පාලන දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්. ''

ඩී. ජී. ඇල්. මිසෝ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1958 නොවැම්බර් මස 26 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් කායර්‍යාලය,
කොළඹ 1.

# ආණ්ඩුවේ නිවේදන

### එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළියෙල කරන ලද මානව අයිතිවාසිකම් ප්‍රකාශනය පිළිබඳ 10 වැනි සාංවත්සර උළෙල නිමිති කොට නිකුත් කරනු ලබන විශෙෂ මුද්දර

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළියෙල කරන ලද මානව අයිතිවාසිකම් ප්‍රකාශනයට දසවසක් සම්පූර්ණවීම නිමිත්තයෙන් 1958 දෙසැම්බර් මස 10 වැනි දින සත 10 සහ සත 85හේ විශෙෂ තැපැල් මුද්දර නිකුත් කෙරෙන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ මුද්දර 1959 අප්‍රෙල් මස 30 වන දිනට කලින් විකිණීම අවසන් නොවුවහොත් එම දින දක්වා විකිණීම පිණිස තබනු ලැබේ. දැනට පවතින එම වටිනාකම් ඇති තැපැල් මුද්දර විකිණීම මේ කාලය තුළ තාවකාලික වශයෙන් නතර කරනු ඇත.

2. පොදු සැලැස්මකින් යුක්ත වූ මෙම තැපැල් මුද්දර දෙකෙන් සමස්ත ලෝක වාසීන් සිය අත් එක්සත් ජාතීන් දෙසට දිගු කර සිටින ආකාරය ප්‍රදර්ශනය කරනු ලැබේ.

ස්ටැන්ලි ද සොයිසා,
මුදල් ඇමති.

1958 නොවැම්බර් 29 වනදා,
කොළඹ,
මුදල් අමාත්‍යාංශය.

### 1947 තේ අංක 30 දරණ ආහාර සැපයීමේ ආඥපනත යටතේ විනිශ්වය සභාවක් පත්කිරීම

(1948 පෙබරවාරි මස 5 වැනි දින අංක 9,828 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ප්‍රකාශයෙන් මදක් වෙනස්කර ඇති) 1947 තේ අංක 30 දරණ, ආහාර සැපයීමේ ආඥ පණතේ, 6වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ, මට පැවරී තිබෙන බලතල අනුව, කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, පහත සඳහන් අයගෙන් සමන්විත වූ විනිශ්වය සභාව, මෙහි සඳහන් කර ඇති ආඥපණත උදෙසා මෙදින සිට පත්කර ඇති බව නිවේදනය කරමි :—

වෝල්ඩෝ සන්සෝනි මහතා, ඕ.බී.ඊ., වී.ඩී., ජේ.පී.යූ.ඇම්.
ජේ. එස්. වික්ටෝරියා මහතා, එම්.වී.ඕ., ඕ.බී.ඊ.
බී. මහාදේව මහතා, සී.සී.ඇස්.

1957 අගෝස්තු 16 වැනි දින අංක 11,157 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනයේ, කේ. බී. දිසානායක මහතාගේ පත්කිරීම සම්බන්ධයෙන් පමණක් එම නිවේදනය මෙයින් වෙනස් කරනු ලැබේ.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

කෘෂිකර්ම හා ආහාර ඇමති කායර්‍යාලය,
යුනියන් පෙදෙස,
කොළඹ 2.
1958.11.24.

### සමිති සමාගම් ආඥපනත (105වැනි පරිච්ඡෙදය)

වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් රිචඩ් ගෝඨාභය සේනානායක වන මම, අංක 9,773 හා 1947 සැප්තැම්බර් 24 වැනි දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ප්‍රකාශයෙන් මඳක් වෙනස් කර ඇති සමිති සමාගම් ආඥපනතේ (105 වැනි පරිච්ඡෙදය) 3 (බී) දරණ වගන්තියෙන් මට පවරා ඇති බලතල ප්‍රකාර, '' සීමාසහිත මහනුවර මුස්ලිම් අධ්‍යාපනික සමිතිය '' නමින් පිහිටුවා ඇති සමිතිය පිහිටුවීමේ අභිප්‍රාව අංක 10,703 හා 1954 අගෝස්තු 13 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණ ලද නිවේදනයෙන් සමිති සමාගම් පණතේ (105 වැනි පරිච්ඡෙදය) බලතල හා පහසුකම් හිමිකර ඇති අභිප්‍රාවක් බව මෙම නිවේදනයෙන් අනුමත කරමි.

ආර්. ජී. සේනානායක,
වාණිජ හා වෙළඳ ඇමති.

1958 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දීය.

1952කේ නො. 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ, 1958 නොවැම්බර් මස 7 වෙනි දින සිට අවුරුද්දක කාලයකට පහත සඳහන් අය මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිවරිය විසින් පත්කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් දෙස්තර පී. ආර්. තෙන්නකෝන් මහතා නම්කරනු ලැබීය.

ඩබ්ලිව්. ජේ. ඒ. වැන්ලැන්ගන්බර්ග්,
ස්ථාවර ලේකම්.

1958 නොවැම්බර් මස 27 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ.

(1) දෙස්තර පී. ආර්. තෙන්නකෝන්.
(2) දෙස්තර එස්. පෙතියාගොඩ.
(3) ඩබ්ලිව්. ඒ. ගුණතිලක මහතා.
(4) ඩී. පෙතියාගොඩ මහතා.
(5) එල්. කුලතුංග මහතා.
(6) ඩී. ඩබ්ලිව්. ද එස්. ගමගේ මහතා.
(7) එල්. බී. ජයසේන මහතා.
(8) එච්. එම්. නවරත්න මහතා.
(9) පී. එස්. ජයවර්ධන මහත්මිය.

### අබිං මණ්ඩලය—කෑගල්ල දිස්ත්‍රික්කය

විෂ අබිං සහ හානිකර බෙහෙත් ආඥපනතේ (172 වෙනි පරිච්ඡෙදය) 41 (2) වැනි වගන්තියේ බලතල අනුව සහ 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් නිවේදනයෙන් සංශොධනය කරන ලද ප්‍රකාශනය අනුව, කෑගල්ල දිස්ත්‍රික්කයේ අබිං මණ්ඩලයේ සාමාජික ධුරයකට කෑගල්ලේ ආයුර්වේද වෛද්‍ය ටී. විලියම් ප්‍රනාන්දු මහතා අද සිට ගරු සෞඛ්‍ය ඇමතිණිය පත්කොට තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ජේ. ඒ. වැන්ලැන්ගන්බර්ග්,
ස්ථාවර ලේකම්.

1958 නොවැම්බර් මස 24 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

## 4 බී පෝර්මය

### 1949 නො 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණත

#### පණතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝසප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජන විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණ නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

1958වූ දෙසැම්බර් මස 2 වෙනි දින
කොළඹ දීය.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස්තැන.

### උපලෙඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J 799—28.2.51 | ... පෙරුමාල් කුප්පන්, සාන්ත ඇන්ඩෘ කොටස, ලක්ෂපාන වතුයාය. මස්කෙළිය | නාගම්මා (භාය්‍යාව), වෙල්ලාච්චි (දුව), නාගම්මා (දුව), පෙරුමාල් (පුතා), සෙවනු (පුතා), ආරුමුගම් (පුතා) රෙන්ගම්මා (දුව), මරුදවීරන් (පුතා) |
| J 1288—20.2.51 | ... මාදසාමිපිල්ලෙයි පෙරියසාමි, ලක්ෂපාන වත්ත, මස් කෙළිය | වල්ලි අම්මෙයි නොහොත් වීරම්මා (භාය්‍යාව), වල්ලි නායගම් (පුතා), මාදසාමි (පුතා), මුප්පුදති නොහොත් සෙවනම්මා (දුව), ක්‍රිෂ්නන් නොහොත් කිට්නපිල්ලෙයි (පුතා), ආවාදෙයිඅම්මා (දුව) |
| J 7308—30.7.51 | ... අබ්දුල් සයිබු ආදම්ෂා නොහොත් මයිල්, මස්කෙළිය වත්ත, මස්කෙළිය | අලිමා බීබී (භාය්‍යාව) |
| L 1482—16.7.51 | ... සෙල්ලදෙරෙයි වාසගම්, හුනුකොටුව කොටස, කැටබුල වතුයාය, කොත්මලේ | සින්නාච්චි (භාය්‍යාව), වේජේරත්නම් (පුතා), මහේස්වරී (දුව), බාලසුන්දරම්මාල් (දුව), මුත්තලම්මා (දුව) ජානකි (දුව), රාජරත්නම් (පුතා), ඥනරත්නම් (පුතා) නවරත්නම් (පුතා) |
| L 7213—29.6.51 | ... රාමයියා අලගන්, මවුන්ට් හවානාවත්ත, ගම්පොල | ... පලනියායි (භාය්‍යාව), සන්ගිලි (පුතා), තන්ගවේල් නොහොත් රාමසාමි (පුතා), මුනියන්ඩි (පුතා), වේලූ (පුතා) පාලමනි (දුව), සිවමනි (දුව) |
| L 9064—24.7.51 | ... රාමන් මුනියන්, මුල්ගම වත්ත, පන්විලතැන්න ... | නාරායනන් (පුතා), ගෝවින්දන් (පුතා) |
| M 202—20.10.50 | ... පෙරුමාල් සුබ්‍රමානියම්, ඕපල්ගල්ල වත්ත, රත්තොට ... | වේලායි (භාය්‍යාව) |
| M 885—12.12.50 | ... කාමාච්චි කරුප්පයියා, ඕවිලිකන්ද වත්ත, මාතලේ ... | සෙවනායි (භාය්‍යාව), සීතායි නොහොත් සීතයියම්මා (දුව), රාමරාජා (පුතා), කෙන්ගනායගී(දුව), සරස්වතී (දුව), තන්ගයියා (පුතා) |
| M 1349—19.5.51 | ... කරුප්පන් සින්නකරුප්පන්, බටහිර මාතලේ වත්ත, මාතලේ | මුක්කායි (භාය්‍යාව), මුනිඅම්මාල් (දුව), වල්ලිඅම්මා (දුව) |
| M 1398—19.5.51 | ... කාලිමුත්තු මුනියන්ඩි, අස්ගිරිය කොටස, බටහිරමාතලේ වත්ත, මාතලේ | පලනියායි (භාය්‍යාව), කදිරවේල් (පුතා), කාලිඅම්මාල් (දුව), වේලායි (දුව), කරුප්පයියා (පුතා) |
| M 1499—8.2.51 | ... ආරුමුගම් සන්දනම්ගේ වැන්දඹුවවූ තෙයිවානෙයි, ආර්. සබ්බයියා මහතාබාරේ, හන්ගුරන්කැත වතුයාය, හන්ගු රන්කැත | මාරියායි (දුව), විජයරාජා (පුතා), සිවසක්ති (දුව), විජෙය ලෙච්චුමී (දුව) |
| M 1553—15.3.51 | ... නයිනමලෙයි මාරිමුත්තු, පිටකන්ද වතුයාය, මාතලේ ... | තන්ගා නොහොත් මාරිඅම්මා (භාය්‍යාව) |
| M 2141—21.6.51 | ... සන්ග්‍රලිංගම් ඩේවිඩ් සන්දනම්, අංක. 58, අගලවත්ත පාර, මාතලේ | ජෙබමාලේ (භාය්‍යාව), ජෙබමාලෙයි (පුතා), අන්නමාරී (දුව), එළිසබෙත් (දුව) |
| M 2436—29.4.51 | ... සින්නතම්බි අලගන්, ඇල්. ඇම්. ඕ. කොටස, හුනස් ගිරිය වතුයාය, වත්තේගම | පාකියම් (භාය්‍යාව), වෙල්ලයන් (පුතා), සිවලිංගම් (පුතා), ධනලෙච්චුමි (දුව), අන්නලෙච්චුමි (දුව) |
| M 2447—29.4.51 | ... සෙල්ලන් පෙරුමාල්, පහළ මහඔය කොටස, හුනස්ගිරිය වතුයාය, වත්තේගම | මුත්තම්මාල් (භාය්‍යාව), පොන්නයියා නොහොත් ගුරු සාමි (පුතා), වල්ලි නොහොත් තයිලම්මා (දුව), ලෙච්චිමි නොහොත් අන්ජලෙයි (දුව), ආරායි (දුව), පොන්නාතාල් නොහොත් පොන්නාච්චි (දුව), සින්දමානි නොහොත් සින්නතාමනි (දුව), නේසන් (පුතා) |
| M 3942—30.5.51 | ... සෙන්නන් සන්ගන්, හපුවිද්ද කොටස, ඇල්කඩුව වතු යාය, ඇල්කඩුව | මීනාච්චි (භාය්‍යාව) සෙලම්බරම් (පුතා), අරියනාච්චි නොහොත් වීරායි(දුව), රත්නම් (දුව), තනලෙච්චුමි (දුව) |
| M 3949—30.5.51 | ... මාරි මුරුගන්, හපුවිද්ද කොටස, ඇල්කඩුව වතුයාය, ඇල්කඩුව | අන්ගම්මාල් (භාය්‍යාව), සිවලිංගම් නොහොත් සෙවුගන් (පුතා), රාමායි (දුව) |
| P 6406—17.2.51 | ... වයියාපුරි ගෝවින්දන්, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන | මරුදයි (භාය්‍යාව), ගෝපාල් (පුතා), රාමර් (පුතා), ලෙච්චිමි (දුව) |
| P 6431—17.2.51 | ... රාමලිංගම් නොහොත් රාජලිංගම් කිට්නන්, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන | මුනිඅම්මාල්(භාය්‍යාව), කොල්ලපුරි (දුව), විජයපෙරුමාල් (පුතා), ජානකිඅම්මා (දුව), තියාගරාජා (පුතා), පුස්පලීලා (දුව), රාජේන්ද්‍රම් (පුතා), ජයප්‍රකාසම් (පුතා) |
| P 6642—19.2.51 | ... සෙම්බුදයර් මුක්කන්, ප්‍රෙස්ටන් වත්ත, අග්‍රපතන ... | සින්නම්මා (භාය්‍යාව), මානික්කම් (දුව), තනලෙච්චිමි (දුව), නවරත්නම් (පුතා), සෙම්බුදයර් නොහොත් සෙම්බයියා (පුතා) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| P 6815—25.2.51 | ... වීරමුත්තු සෙල්ලමුත්තු, කැලිඩෝනියා වත්ත, ලිඳුල | සීවටු (භාර්‍යාව), පොන්නම්මාල් (දුව), කන්දසාමි (පුතා) |
| A 8543—6.5.51 | ... කරුප්පයියා ලෙච්චුමන්, අග්‍ර ඇල්බැද්ද වත්ත, අග්‍රපතන | වීරායි (භාර්‍යාව), පාලම්මා නොහොත් ගෝවින්දම්මාල් (දුව), ක්‍රිෂ්නන් නොහොත් කිට්නසාමි (පුතා), කාවෙරි අම්මා (දුව), සේතරාම් (පුතා) |
| Q 4787/P—8.4.51 | ... වේලයුදම් තම්බුසාමි, හෙන්වෝල්ඩ් වත්ත, ලිඳුල ... | පාපාති (භාර්‍යාව), ධර්මරාජ් (පුතා), තෙයිවානෙයි (දුව) |
| Y 2150—31.1.51 | ... සින්නයියා මාරිමුත්තු, රුකතැන්න වත්ත, හාලිඇල ... | පලනියායි (භාර්‍යාව), සෙල්ලදෙරෙයි නොහොත් කන්නි මුත්තු (පුතා), පෙරියසාමි (පුතා), වල්ලිඅම්මා (දුව), මුත්තම්මා (දුව), තෙයිවානී (දුව), සුබ්‍රමානියම් (පුතා), චින්තාමනි (දුව) |
| Y 2152—30.11.50 | ... කිට්නන් සුප්පන්, උතුරුකොටස, රුකතැන්න වතුයාය, හාලිඇල | සෙල්ලම්මා (භාර්‍යාව), පාප්පයියා (පුතා) |
| V 4900—10.5.51 | ... මුනියන්ඩි නාගලිංගම්, මහතැන්න කොටස, ඩැමේරියා වතුයාය, පස්සර | සීතායි නොහොත් වේලායි (භාර්‍යාව), පරමේෂවරි නොහොත් නාගම්මා (දුව), ධර්මලිංගම් (පුතා) රාමලිංගම් (පුතා), අලගිරි (පුතා), නාගරත්නම් (පුතා) |
| AA 589—23.11.50 | ... අදිමූලම් මරදමුත්තුපිච්චෙයි, මැන්දිස් විජේවීර මහතා බාරේ, දෙල්ගමුව, කුරුවිට | සීලවතී (භාර්‍යාව), අරමු නොහොත් තන්ගමනි (දුව) තිරුවෙල්වම් (පුතා), කමළම් (දුව), රාජම් (දුව), බාලසුන්දරම් (පුතා), දේවකිරානි (දුව), මල්ලිකාලීලා (දුව) |
| AA 646—6.12.50 | ... ඩේනියල් රාමසාමි, පල්ලවෙල වත්ත, රත්නපුර ... | මාරියායි (භාර්‍යාව), නාගම්මා නොහොත් කාමාච්චි (දුව), පාකියම් (දුව) |
| AA 762—21.4.51 | ... මුත්තු කරුප්පන් සන්ගපිල්ලෙයි, වෙල්වල කොටස අළුපොල වතුයාය, රත්නපුර ... | පාපාති (භාර්‍යාව), සිවරාමන් නොහොත් ජයරාමන් (පුතා), ලෙච්චිමී නොහොත් ජයලෙච්චිමී (දුව), තන්ගරාජා (පුතා), සරස්වති (දුව), සෙල්වරත්නම් (පුතා), ආරුමුගම් (පුතා), රාමචන්ද්‍රන් (පුතා) |
| AA 2170—27.7.51 | ... ජෝශප් ජෝශප්, රඹුක්කන්ද වතුයාය, රත්නපුර ... | ජොසලින් එළිසබෙත් (භාර්‍යාව), වික්ටර් ලියෝ (පුතා), ජෝජ් නිකුලස් (පුතා) |
| AA 2457—22.7.51 | ... ඇලන් ගෙන්ගන්, අංක 1, තේ කොටස, දුම්බරවත්ත, ඉංගිරිය | සිවනු (පුතා), රාමයියා (පුතා), සුප්පයියා (පුතා), මුරුගයියා (පුතා), අරසන් (පුතා) |
| AA 2866—30.7.51 | ... මරුදමුත්තු මුනියන්ඩි, පහළ කොටස, ලැන්ස්ඩවුන් වත්ත, රත්නපුර | වෙල්ලයම්මා (භාර්‍යාව), සන්දනම් නොහොත් අලගම්මා (දුව), සිවනාදන් නොහොත් සෙවනාදියන් (පුතා), තෙයිවානි නොහොත් තෙවූනමනි (දුව) |
| AA 3306—29.7.51 | ... වේළු පොන්නයියා, දෙනවක වතුයාය, පාතකඩ, පැල් මඩුල්ල | කුන්ජාරම් (භාර්‍යාව) |
| AA 5861—1.7.51 | ... පලනියන්ඩි වේළු, මාරබේකන්ද වත්ත, පුවක්පිටිය ... | තෙයිවානෙයි (භාර්‍යාව), මගමායි නොහොත් ජානකී (දුව), සෙවනු (පුතා), තෙයිවමනි (දුව), පච්චිමුත්තු (පුතා) |
| AA 7305—18.6.51 | ... මුත්තුසාමි මුත්තුසාමි, අංක. 42, ගලේබොඩ, ගල්ලැල්ල, රත්නපුර | මුක්කායි (භාර්‍යාව), නාච්චිඅම්මා (දුව), විස්වලිංගම් (පුතා), වනතායි (දුව), ලෙච්චිමන් (පුතා), සෙල්ල පෙරුමාල් (පුතා), කන්දයියා (පුතා) |
| AA 2541/BB—27.7.51 | ... පලනියන්ඩි රත්නගිරි සින්නයියා, ශ්‍රී ධර්මානන්ද පිරිවෙන, බලන්ගොඩ | සෙල්ලම්මා (භාර්‍යාව) |
| BB 199—17.4.51 | ... නීලමුගන් රාමනාදන්ගේ වැන්දඹුවවූ වෙල්ලම්මා, බුලත් ගම, බලන්ගොඩ | දෙරෙයිරාජා (පුතා), කුමාරවේළු (පුතා), ධර්මරත්නම් (පුතා), සෝමරත්න (පුතා) |
| BB 659—29.4.57 | ... සුප්පායියා මුත්තුසාමි ආසාරි සන්මුගම්, බුලත්ගම වත්ත, බලන්ගොඩ | මරුදයි (භාර්‍යාව), කනකම් (දුව), මුත්තුසාමි නොහොත් මුත්තයියා (පුතා), සිවලිංගම් (පුතා), අමුර්තවල්ලි (දුව) |
| BB 2646—31.7.51 | ... සින්නයියා සෙලම්බරම්, සයිප්‍රස් වත්ත, රක්වාන ... | පොට්ටු (භාර්‍යාව), මුත්තයියා (පුතා), මාරිඅම්මා (දුව), පොන්නම්මා (දුව) |
| J 35/11/Q/BB—3.7.51 | ... ආබ්‍රහම් පෝල්, දලුක්ගල්ල වත්ත, කහවත්ත ... | ලිලී අන්නාල් (භාර්‍යාව), වික්ටර් එම්මානුවෙල් (පුතා), වයලට් පුස්පම් (දුව), සැමුවෙල් (පුතා), දේවදසන් (පුතා), ජෝයිරුත් (දුව), ස්ටීවන් අරුලයියා (පුතා), ජෙසී තන්ගතායි (දුව), මර්සි අන්නාල් (දුව), පාකියනාදන් (පුතා) |
| K 8648/BB—15.7.51 | ... මුනියන්ඩි සින්න මානියම්, සමුපකාර ගබඩාව, බලන් ගොඩ වතුයාය, බගවන්තලාව | කාන්තිඅම්මාල් (භයයීාව), සේකුරාම් (පුතා) |
| BB 865/AA/BB—9.6.51 | ... ඉරුලප්පන් පෙරියකරුප්පන්, නලුවෙල කොටස, වැව වත්ත, බලන්ගොඩ | මුත්තුකරුපි (භාර්‍යාව), වීරන්නන් නොහොත් වීරයියා (පුතා), වේළුසාමි (පුතා), රාමයියා (පුතා) |
| V 4944—10.5.51 | ... මාරිමුත්තු සොලෙයිමුත්තු, මහතැන්න කොටස, ඩැමේරියා වතුයාය, පස්සර | මාරියායි (භාර්‍යාව), සුන්දරම් (පුතා), නවුචතිරම් නොහොත් තෙයිවානෙයි (දුව), මසිලමනි (පුතා), කරුම් බායිරම් නොහොත් කරුම්පයා (පුතා), තන්ගයියා (පුතා), පාලයියා (පුතා) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ගොඩ්ෆ්‍රේප්‍රසාද් තම්බයියා වන මම, 1947තේ අංක 8 දරණ ආණ්ඩුවේ ඉඩම් ආඥාපනතේ 64 වෙනි කොටසින් මා වෙත පැවරී ඇති බලතල අනුව, මීට අදාල උප ලේඛනයේ විස්තර කර ඇති මුහුදු වෙරළ බද ප්‍රදේශයෙන්, වැලි, කොරල් සහ වෙනත් දෙය ඉවත් කිරීම තහනම් කරමි.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කච්චේරිය, කොළඹ,
1958 නොවැම්බර් මස 24.

උපලේඛනය

උතුරට පමුණුගම ගම්මුලාදැනි කොට්ඨාශය සහ කැපුන්ගොඩ ගම් මුලාදැනි කොට්ඨාශය වෙන්වන මායිමත්, දකුණට උස්වැටකෙයියාව ගම්මුලාදැනි කොට්ඨාශය සහ පල්ලියවත්ත ගම්මුලාදැනි කොට්ඨාශය වෙන්වන මායිමත් අතර පිහිටි මුහුදු වෙරළ බද ප්‍රදේශය.

---

## "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති භයානක රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ විල්ලි හත්පත්තුවේ මහගල්බඩ කෝරළයේ රනවන පළාතේ ගවයින් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් බෝවන රෝග සම්බන්ධ ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාත් ලෙස මා විසින් වර්ෂ 1958ක්වූ ජූලි මස 25 වෙනි දින නො. 11,436 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහ දිසාපතිතුමා.

22.11.1958,
කච්චේරිය, කුරුණෑගල.

---

## "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති භයානක රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩ විල්ලි හත්පත්තුවේ ගන්නෑව කෝරළයේ කලුගොමුව පළාතේ ගවයින් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැව් බෝවන රෝග සම්බන්ධ ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාත් ලෙස මා විසින් වර්ෂ 1958ක්වූ අගෝස්තු මස 8 වෙනි දින නො. 11,471 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහ දිසාපතිතුමා.

22.11.1958,
කච්චේරිය, කුරුණෑගල.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955** ජනවාරි 1 වැනි දින සිට අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින** අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දයක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දයක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දයක මුදල ... ... .. | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... .. | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.